**ශ්‍රී ලංකා තේ මණ්ඩලය - 2017**

**-----------------------------------------**

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 15(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී . මුදල් පනතේ 14(2) සී වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) ඒ වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2018 මැයි 31 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

---

ප්‍රමිතයේ 132 ඡේදය ප්‍රකාරව වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වුවත් මණ්ඩලය විසින් රාජ්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීමට අදාලව අනුගමනය කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

---

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.74,615,225 ක් වූ යන්ත්‍රෝපකරණ, රසායනාගාර උපකරණ සහ ලීබඩු හා සවිකිරීම් යනාදී වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19

---

ප්‍රමිතයේ 57 (ඩී) ඡේදය ප්‍රකාරව, සේවක පාරිතෝෂිත සම්බන්ධයෙන් ආයුගණක ලාභ හෝ අලාභ ගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට විදේශ තේ ප්‍රවර්ධන කාර්යාංශය සඳහා කරන ලද තැන්පත් හා කලින් ගෙවීම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි රු.23,159,935 ක් දක්වා තිබුණද එදිනට අදාල විනිමය අනුපාතය අනුව එම වටිනාකම ගැලපීම්කර ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ විකුණන ලද වාහන 4 කට අදාලව ප්‍රත්‍යාගණන සංචිතයේ ඇතුලත්ව තිබූ රු.6,250,000 ක් වූ ප්‍රත්‍යාගණන ලාභය රඳවාගත් ලාභයට ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය කාර්යාල රැස්කිරීමේ බැංකු ගිණුම්වලට සෘජු තැන්පත් ලෙස ලැබී තිබුණු රු.363,624 ක් හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි.

## 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව, කලින් ලද ප්‍රචාරණ හා ප්‍රවර්ධන ගාස්තු වටිනාකම රු.28,441,373 ක් වුවද ඒ සඳහා පවත්වාගෙන ගිය ලේඛනය අනුව එම වටිනාකම රු.35,892,100 ක් වූයෙන් රු.**7,450,727** ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනට එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ප්‍රවර්ධන කාර්යාංශයේ මුදල් හා බැංකු ශේෂය රු.4,499,717 ක් ලෙස දක්වා තිබූ නමුත් ශේෂ සනාථ කිරීම් ලිපිය අනුව එම ශේෂය රු. 2,470,416 ක් වුයෙන් රු.2,029,301 ක පැහැදිලි නොකල වෙනසක් නිරූපනය විය. තවද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මණ්ඩලය මගින් මෙම වෙනස හඳුනා ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| | ගිණුම් විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|---|
| (අ) | තානාපති කාර්යාල 06 ක් වෙත ප්‍රේෂණය කර තිබූ මුදල | 1,175,374 | ශේෂ සනාථ කිරීම් |
| (ආ) | රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය සඳහා කල්බදු පදනම මත මිලදීගෙන තිබූ ගොඩනැගිල්ල | 3,435,000 | ගෙවීම් තහවුරු කිරීමට අදාල සාක්ෂි |

## 2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පෝලන්තයේ විදේශ තේ ප්‍රවර්ධන ඒකකය පවත්වාගෙන යාම සඳහා බදු පදනම මත ලබාගෙන තිබූ ගොඩනැගිල්ලෙහි ගිවිසුම 2010 වර්ෂයේදී අවසන්වී ඇතත් ඒ සඳහා ගෙවන ලද මූලික මුදල රු. 207,360 ක් මෙම වාර්තාවේ දින දක්වාම ආපසු අය කරගෙන නොතිබුණි.

(ආ) තුරඟ තරග පිටියේ පවත්වාගෙන ගිය තේ අලෙවි හල පවත්වාගෙන යාම සඳහා ලබාගෙන තිබූ ගොඩනැගිල්ල වෙනුවෙන් 2014 වර්ෂයේ දී තැන්පත් කරන ලද රු.100,000 ක ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පතු මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පතු රු.200,983ක් හා රඳවාගන්නා ලද මුදල් රු.2,191,499 ක් වසර තුනක් ඉක්මවා ඇතත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2012 වර්ෂයේ සිරියාවේ පැවැත්වීමට සැලසුම්කර තිබූ "ෆුඩ්එක්ස් සිරියා " ප්‍රදර්ශණය සඳහා පුද්ගලික ආයතනයකට රු.629,261 ක ගෙවීම්කර තිබුණද එම ප්‍රදර්ශණය අවලංගුකර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම මුදල් ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට තේ කම්හල් හිමියන් විසින් හරිත තේ සපයන්නන් වෙත ගෙවීම සඳහා මණ්ඩලයේ තැන්පත් කර තිබූ වසර 1 සිට වසර 15 දක්වා කාල පරාසයකට අයත් රු. 6,698,817ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි

## 2.4 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 13 හා 14 වගන්ති | පනතේ විධිවිධාන අනුව සෙස් අරමුදල පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම මණ්ඩලය මගින් සිදුකලයුතු නමුත් වර්තමානයේ සෙස් බදු අයකිරීම මහා භාණ්ඩාගාරය මගින් සිදු කරන බැවින් ඒ අනුව පනත සංශෝධනය කර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. |
| (ආ) | 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 හා 12 වගන්ති | පොදු කොන්ත්‍රාත් රෙජිස්ටාර්වරයා යටතේ වලංගු ලියාපදිංචි කිරීමේ සහතිකයක් නොමැති ටෙන්ඩර්කරුවන් සමග ප්‍රසම්පාදන හා ඇගයීම් කමිටුවල නිලධාරීන් කටයුතු නොකලයුතු නමුත් නුවරඑළියේ කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම පිළිබඳ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 ඡේදය | මණ්ඩලය විසින් මානව සම්පත් කලමනාකරණය සඳහා නීතිරීති සම්පාදනය කිරීමට අදාළ කාර්ය පරිපාටි අත්පොතක් සකස්කර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

---------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2000 ජනවාරි 11 දිනැති පීඑෆ්/පීඊ/05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කිසියම් මූල්‍ය ප්‍රතිලාභයක් ගෙවීමට පෙර භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී විශ්‍රාමලත් නිලධාරීන්ගේ ඉතිරි කරගත් විවේක නිවාඩු වෙනුවෙන් භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමකින් තොරව රු.542,548 ක් ගෙවීම් කර තිබුණි.

(ආ) 2010 ඔක්තෝබර් 27 දිනැති අංක 1677/14 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව ප්‍රවර්ධන හා අලෙවිකරණ අරමුදලෙහි අරමුදල්, එහි අරමුණු ඉටුකර ගැනීම සඳහා පමණක් යෙදවිය යුතු බව දක්වා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත පමණක් එම අරමුදලෙහි පොලී ආදායමෙන් පිළිවෙලින් රු.45,500,000 ක් සහ රු.30,044,000 ක් මණ්ඩලයේ ආදායම් ලෙස හඳුනාගෙන වියදම් සඳහා යොදාගෙන තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.89,967,892 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,677,534 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.85,290,358 ක එනම් සියයට 1,823 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.55,594,152 කින් වැඩිවීමත් සංවර්ධන වියදම් සහ සහ පරිපාලන වියදම් රු.24,775,756 කින් අඩුවීමත් ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු.19,071,236 ක්වූ මණ්ඩලයේ අතිරික්තය 2015 වර්ෂය අවසානය වනවිට රු.86,256,974 ක් දක්වා අඛණ්ඩව වැඩි වී තිබුණද 2016 වර්ෂයේදී රු.4,677,534 ක් දක්වා සියයට 85 කින් පිරිහී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේදී රු.89,967,892 ක අතිරික්තයක් ඇති වී තිබූ අතර 2016 වර්ෂයට සාපේක්ෂව එහි වර්ධනය සියයට 1823 ක් විය. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැළපීමේදී 2013 වර්ෂයේදී රු.180,968,362 ක්වූ මණ්ඩලයේ දායකත්වය 2015 වර්ෂය වනවිට රු.332,983,533 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණද 2016 වර්ෂයේදී රු.240,115,107 ක් දක්වා අඩුවී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේදී නැවතත් රු.304,945,902 ක් දක්වා දායකත්වයේ වර්ධනයක් ඇති වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා පිළියෙල කර තිබූ උපායමාර්ග සැලැස්ම සඳහා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබූ අතර යාවත්කාලීන කරන ලද උපාය මාර්ග සැලැස්මේ පිටපතක් මූල්‍ය වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර නොතිබුණි.

(ආ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව නියාමන ආයතන විසින් පනතේ නියමකර ඇති පරමාර්ථ ඉටුකිරීම සඳහා ක්‍රියාකාරකම් දිගුකාලීන දැක්මක් සහිතව ඇතුලත්කර ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. එහෙත් 2017 වර්ෂය සඳහා මණ්ඩලය විසින් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම සඳහා වූ චක්‍රලේඛය පරිදි රජයේ ප්‍රදාන, ඉපැයීම් හා සම්පූර්ණ වියදම් සහිත අයවැය, ඒ ඒ ක්‍රියාකාරම් තුලින් අපේක්ෂිත ප්‍රතිඵල, මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදනය කරනු ලබන අයවැය වෙන්කිරීම් තුලින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකම් සම්බන්ධ අග්‍රිම අවශ්‍යතා සැලැස්ම යන අංග ඇතුලත් කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

සමාලෝචිත වර්ෂය තුල මණ්ඩලයේ අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, කම්හල් නවීකරණ සහනාධාර යෝජනා ක්‍රමය, තේ නැවත වගා සහනාධාර යෝජනා ක්‍රමය, පසු අස්වනු හානි අවම කිරීමේ වැඩසටහන, දැනුවත් කිරීමේ වැඩසටහන් හා තේ ඉඩම් ලියාපදිංචිය යන සංවර්ධන වැඩසටහන් 05 ක් ක්‍රියාත්මක කිරීමට රු.104,000,000 ක් වෙන්කර තිබුණු අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කම්හල් නවීකරණ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ කම්හල් 70 ක් නවීකරණය සඳහා රු. 40,000,000 ක් වෙන් කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී රු.7,834,287 ක් වැය කර කම්හල් 13 ක් පමණක් නවීකරණය කර තිබුණි. එය සහනාධාර ලබාදීමට අපේක්ෂිතව තිබූ කම්හල් සංඛ්‍යාවෙන් සියයට 18 ක් පමණි.

(ii) තේ නැවත වගා සහනාධාර වැඩසටහන තුලින් සමාලෝචිත වර්ෂයේදී ඉඩම් හෙක්ටයාර් 250 ක් වගා කිරීමට රු. 40,000,000 ක් වෙන් කර තිබුණද මණ්ඩලයේ ප්‍රගති වාර්තා අනුව ඉඩම් හෙක්ටයාර් 177.64 ක් වගා කිරීමට රු.9,658,854 ක් පමණක් වැය කර තිබුණි. ඒ අනුව ලඟාකරගැනීමට හැකිව තිබූ මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 24 ක් හා සියයට 71ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙකකට අදාලව දේශීය නිෂ්පාදිත තේ අපනයනය හා ප්‍රතිඅපනයනය සම්බන්ධ විස්තර පහත පරිදි වේ.

| විස්තරය | 2017 | 2016 | 2015 |
|---|---|---|---|
| | කි.ග්‍රෑ. | කි.ග්‍රෑ. | කි.ග්‍රෑ. |
| තේ අපනයනය | | | |
| දේශීය තේ | 278,195,150 | 280,874,278 | 298,906,481 |
| ආනයනික තේ(ප්‍රති ) | 10,789,117 | 7,896,402 | 8,029,940 |
| සමස්ත තේ අපනයනය | 288,984,267 | 288,770,680 | 306,936,421 |
| තේ ආනයනය | 7,679,588 | 4,660,293 | 4,906,862 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ සමස්ත තේ අපනයනය ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩි වී තිබුණ ද දේශීය නිෂ්පාදිත තේ අපනයනය කිලෝග්‍රෑම් 2,679,128 කින් පහත වැටී තිබුණි. ප්‍රති අපනයනය කිරීම සඳහා ආනයනය කරන ලද තේ ප්‍රමාණය පසුගිය වර්ෂයට වඩා සියයට 65 කින් ඉහල ගොස් තිබූ අතර ඒ අනුව ප්‍රති අපනයන තේ ප්‍රමාණය ද කිලෝග්‍රෑම් 2,892,715 කින් එනම් සියයට 43 කින් වර්ධනය වී තිබුණි.

(ii) මණ්ඩලය ක්‍රියාත්මක කර තිබූ සන්නාම ප්‍රවර්ධන වැඩසටහන සඳහා රු.177,315,426 ක් වැය කර තිබූ නමුත් දේශීය තේ අපනයනය පහල ගොස් ඇති බැවින් අපේක්ෂිතව තිබූ නව වෙළඳපොල හඳුනා ගැනීම් සහ අපනයන ප්‍රවර්ධන ඉලක්ක ලබා කර ගැනීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) තේ ප්‍රවර්ධනය සහ වෙළඳපොල උපාය මාර්ග සඳහා 2010 ඔක්තෝබර් 27 දිනැති අංක 1677/14 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද දැන්වීම ප්‍රකාරව තේ අපනයන කරුවන්ගෙන් 2018 දෙසැම්බර් 31 දක්වා එකතුවන බදු මුදලින් රු. බිලියන අටක් යොදවා "සිලෝන් තේ ගෝලීය ප්‍රවර්ධන වැඩසටහන" 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මෙම ප්‍රවර්ධන වැඩසටහන 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුල නිෂ්පාදන හා නිර්මාණාත්මක කටයුතු ,මහජන සම්බන්ධතා සහ මාධ්‍ය කටයුතු යන කාර්යයන් ඔස්සේ ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබුණද ,එය අදාළ කාලපරිච්ඡේදය තුළ ඉටුකිරීමට නොහැකි වීම හේතුවෙන් 2018 වර්ෂය දක්වා දීර්ඝ කර තිබුණි.

තවද, නිෂ්පාදන හා නිර්මාණාත්මක කටයුතු සඳහා පෞද්ගලික සමාගමක් සමඟ මණ්ඩලය ඇ.ඩො 2,260,000ක (රු.328,423,200) එක් අවුරුදු ගිවිසුමකට 2015 නොවැම්බර් 06 දින එළඹ තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඒ සඳහා රු.195,521,240 ක් ගෙවා තිබුණද මාධ්‍ය කටයුතු සඳහා ආයතනයක් මෙම කාර්යයට සමගාමීව පත්කර ගැනීමට නොහැකිවීම හේතුවෙන් අපේක්ෂිත කාර්යයන් සම්පූර්ණ කර නොතිබුණි.

(ii) රූපවාහිනී වෙළඳ දැන්වීමේ නිර්මාණාත්මක කටයුතු 2016 අප්‍රේල් වනවිට අවසන් කර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට මාස 18ක් ඉක්ම වී තිබුණද එම දැන්වීම ප්‍රචාරය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. ඒ හේතුවෙන් එම දැන්වීම ආශ්‍රයෙන් ඉදිරි ප්‍රවර්ධන කටයුතු සිදුකිරීම තුල කාලීන වෙළඳපල තත්ත්වයන්ට උචිත වන ආකාරයට නිර්මාණය ඵලදායී වීමට ඇති ඉඩකඩ අවම වන බව නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ පැවති අධික වර්ෂාව හේතුවෙන් ඇතිවූ ගංවතුර තත්ත්වය නිසා හානියට පත් කර්මාන්තශාලා සඳහා සහනාධාර ගෙවීම් කිරීමේ දී කර්මාන්තශාලා විසින් ඉදිරිපත් කරනු ලබන මාසික වාර්තාවල (ටී.සී.5) දැක්වෙන හානි වූ තොග ප්‍රමාණයට වඩා වැඩි තොග ප්‍රමාණයකට ගෙවීම් කිරීම හේතුවෙන් කර්මාන්තශාලා 2ක් සඳහා රු.819,567ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) නිෂ්පාදිත තේවල තත්ත්වය හා කීර්ති නාමය ආරක්ෂා කර ගැනීම සඳහා අපනයනය කරනු ලබන නිෂ්පාදිත තේවල ඇති පළිබෝධනාශක අවශේෂ පිළිබඳ පරීක්ෂාකිරීම කාලීන අවශ්‍යතාවයක් වුවද මණ්ඩලයේ රසායනාගාරය මගින් එම පරීක්ෂාවන් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ අමු තේ දළු සඳහා රු.80 ක අවම මිලක් පවත්වා ගැනීම සඳහා දළු සැපයුම්කරුවන්ට ගෙවීම පිණිස පෞද්ගලික කර්මාන්තශාලාවක් සඳහා ලබා දී තිබූ රු.3,489,773ක මුදල දළු සැපයුම්කරුවන් වෙත ලබාදී නොතිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම මුදල ආපසු මණ්ඩලය වෙත අයකර ගෙන නොතිබුණි.

(ආ) 2012 ජුනි 19 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේ නියෝගය අනුව ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් ලැබිය යුතු රු.25,000,000 ක් වෙනුවෙන්, ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් හන්තාන පිහිටි "සිලෝන් ටී මියුසියම්" හි අයිතිය අත්කර ගැනීම හා ශේෂය කපා හැරීමට ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා තේ මණ්ඩලය තීරණයකට එළඹ තිබුණද 2018 මාර්තු 31 දක්වාම මෙම ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේ අමු තේ දළු සඳහා රු.80 ක අවම මිලක් පවත්වා ගැනීම සඳහා දළු සැපයුම්කරුවන්ට ගෙවීම පිණිස මණ්ඩලය වෙත මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ රු.6,738,000,000 ක් වූ සහනාධාර මුදලින් ඉතිරි රු.18,005,828 ක් 2015 දෙසැම්බර් 31 දින සිට භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රඳවාගෙන තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ චීනයේ තේ කාර්යාංශයේ වියදම් සඳහා ලබාදෙන ලද අත්තිකාරම් රු.15,630,566 ක් වර්ෂය අවසානය වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

----------------------------

2013 වර්ෂයේ දී රු.58,368,794 ක් වැයකර කොළඹ තුරඟ තරඟ පිටියේ ස්ථාපනය කළ තේ අලෙවි මධ්‍යස්ථානය සමාලෝචිත වර්ෂයේ දී මෙහෙයුම් කටයුතු අත්හිටුවා වසා දැමීමට පියවර ගෙන තිබුණි. තේ ප්‍රවර්ධන උපාය මාර්ගයක් ලෙස ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය ආරම්භයේ සිටම ඉලක්ක ගත වෙළඳපළ සහ ඉදිරි උපනතීන් පිළිබඳ සැලකිල්ලට ගනිමින් වඩා ඵලදායී අයුරින් ක්‍රියාත්මක කල හැකි අනාගත වැඩ පිළිවෙලක් මණ්ඩලය සතුව නොතිබීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ඵලදායී ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබූ අතර ව්‍යාපෘතිය තුලින් රු. 42,994,720 ක මූල්‍ය අලාභයක් මණ්ඩලයට දැරීමට සිදු වී තිබුණි.

**4.4** **අරමුදල් ඌන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එක්සත් අරාබි එමීර් රාජ්‍යය (ඩුබායි) හි පිහිටි විදේශ ප්‍රවර්ධන ඒකකයේ ජංගම ගිණුමේ, සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා සෑම මාසයකම රු.3,000,000 ක් ඉක්මවන ශේෂයක් පැවතියද එම මුදල ඵලදායී අයුරින් ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මණ්ඩලයට අයත් වටිනාකම රු.760,545 ක් වූ විදේශීය බැංකු ගිණුම් 05ක ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 05 දක්වා වූ කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

**4.5** **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේදී රු.32,132,088 ක් වැයකර මිලදී ගන්නා ලද පලිබෝධනාශක රසායනික සංඝටක විශ්ලේෂණ යන්ත්‍රය හා රු.5,592,421 ක් වැයකර මිලදී ගන්නා ලද CP-3800 GAS Chromatography යන්ත්‍රය සමාලෝචිත වර්ෂය දක්වා භාවිතයට ගෙන නොතිබුණි. මණ්ඩලයේ අපේක්ෂිත පිරිවිතරයන්ට අනුකූල නොවීම හා යන්ත්‍ර ක්‍රියාකිරීම පිළිබඳව පුහුණුවක් සැපයුම්කරුවන් විසින් ලබා දී නොමැති වීම ඊට හේතු වී තිබුණි.

(ආ) 2015 වර්ෂයේ මිලදී ගෙන තිබු රු.5,140,707ක් වටිනා කාර්යාල උපකරණ, ලී බඩු හා සවිකිරීම් හා පරිගණක තේ අලෙවි මධ්‍යස්ථානය වසාදැමීම හේතුවෙන් භාවිතයෙන් තොරව නිශ්කාර්යව පැවතුණි.

**4.6** **ආර්ථික නොවූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සඳහා 2013 වර්ෂයේ දී පෞද්ගලික සමාගමක් වෙත අත්තිකාරම් ලෙස රු. 330,850 ක් ගෙවීම් කර තිබියදී සමාලෝචිත වර්ෂය අවසානය වනවිට මෙම කාර්යය අත්හැර දමා තිබුණි.

(ආ) 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත, 1957 අංක 51 දරන තේ පාලන පනත හා 1959 අංක 16 දරන තේ (බදු හා පාලන) පනත යන පනත් ඒකාබද්ධ කර නව පනතක් ඇති කිරීම සඳහා 2015 වර්ෂයේදී උපදේශකයෙකු සමඟ ගිවිසුමකට එළඹ උපදේශක ගාස්තු ලෙස රු.105,000ක් දරා තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පනත් ඒකාබද්ධ කිරීම අවශ්‍ය නොවන බව තීරණය කර අදාළ කාර්යය අත්හැර දමා තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් තුරඟ තරඟ පිටියේ පවත්වාගෙන ගිය තේ අලෙවි මධ්‍යස්ථානය සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ සිට වසාදමා තිබු නමුත් එය පවත්වාගෙන ගිය ගොඩනැගිල්ල ආපසු භාරදීම ප්‍රමාදවීම හේතුවෙන් මාසික කුලිය වශයෙන් රු.1,140,544 ක් සමාලෝචිත වර්ෂයේ දරා තිබුණි.

## 4.7 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම් සහ දේපළ වල ව්‍යාපෘති ආරම්භ කිරීම.

නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලය ඉදිකරමින් පවතින සීමාසහිත කැළණිවැලි වැවිලි සමාගමට අයත් හා බණ්ඩාරවෙල ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල පිහිටි වී අලෙව් මණ්ඩලයට අයත් ඉඩම්වල අයිතිය මෙම වාර්තාවේ දින දක්වා මණ්ඩලයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිකිරීම් කටයුතු සඳහා රු.114,335,962 ක් වැය කර තිබුණි.

## 4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 317 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 281 ක් විය. ජ්‍යෙෂ්ඨ, තෘතීය හා ද්විතීය මට්ටමේ නිලධාරීන්ගේ පිළිවෙලින් 03 දෙනෙකු, 04 දෙනෙකු හා 33 දෙනෙකු සහ ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් 09 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණු අතර අනුමත කාර්ය මණ්ඩලයේ නොමැති ජ්‍යෙෂ්ඨ තනතුරක්, තෘතීය මට්ටමේ තනතුරක් සහ ද්විතීය මට්ටමේ තනතුරු 05 ක් වෙනුවෙන් පිළිවෙලින් නිලධාරීන් 01 ක්, 01 ක් හා 11ක් සේවයේ යොදවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයේ නොමැති තනතුරු නාම සහිතව කාර්ය පැවරුම් පදනම මත නිලධාරින් 05 දෙනෙකු පත් කර තිබුණි.

## 4.9 වාහන උපයෝජනය

මණ්ඩලය සතු භාවිතයෙන් ඉවත්කරන ලද කැබ් රථ දෙකක, තක්සේරු වටිනාකම වාරික වශයෙන් මණ්ඩලයට ගෙවීමේ පදනම මත ජාතික වැවිලි කළමණාකරන ආයතනය වෙත, සමාලෝචිත වර්ෂයේ ලබා දී තිබූ නමුත් වාර්තාවේ දින දක්වා මේ සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹ නොතිබුණු අතර එම ආයතනයෙන් වාරික ගෙවීම් සිදුකර නොතිබුණි.

## 4.10 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තේ කොමසාරිස් අංශය විසින් පරිහරණය කරන ලද ගොඩනැගිල්ලේ අයිතිකරු විසින් ගොඩනැගිල්ලට වූ හානි වෙනුවෙන් හා ඒ හේතු කොටගෙන ගොඩනැගිල්ල වෙනත් පාර්ශවයකට කුලියට දීම සඳහා භූමිය ප්‍රකෘති තත්ත්වයට පත්කිරීමට නොහැකිවීම මත රු.4,900,000 ක මුදලක් ඉල්ලා 2008 ඔක්තෝබර් මාසයේ දී මණ්ඩලයට එරෙහිව තීරකවරයෙක් පත්කර තිබුණි. ඒ අනුව තීරකවරයාගේ තීන්දුව ප්‍රකාරව 2012 නොවැම්බර් 14 දිනට ඉහත මුදල සහ ඊට සියයට 20ක වාර්ෂික ගාස්තුවක් ඇතුලත්ව එකතුව රු.13,828,600 ක් ගෙවිය යුතු බවට නියෝගයක් දී තිබුණි. කෙසේ වුවද, මණ්ඩලය විසින් මෙම තීරණයට එරෙහිව අභියාචනයක් ගොනු කර තිබුණි.

(ආ) බාහිර ආයතන 6ක් විසින් මණ්ඩලයට එරෙහිව අධිකරණවල නඩු 7 ක් සහ කාර්ය මණ්ඩලය විසින් විවිධ අධිකරණ වල නඩු 3 ක් ගොනු කර තිබුණි.

# 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තිරසර ඉලක්ක කරා ළඟා වීම සඳහා ආයතන විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුළත් කර නොතිබූ අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂිකව අයවැයට ඇතුළත් කර නොතිබුණි.

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට සූදානම්වීමේදී අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොකිරීම හේතුවෙන් ඉලක්ක ගත අරමුණු කරා ළඟාවීමට සැලසුම් සකස් කිරීමේ හා පෙර සූදානම්වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී තත්ත්වයක් පැවති බව නිරීක්ෂණය විය.

## 6. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

## 6.1 අභ්‍යන්තර විගණනය

මණ්ඩලයේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණද එම අංශය සඳහා ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් අනුයුක්ත කර නොතිබුණි.

## 6.2 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.2.1 ප්‍රසම්පාදනයන්

ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනයේ චක්‍රලේඛයේ 4.2 ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුගත කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන සැලැස්ම, වර්ෂයේ අයවැය අනුව ප්‍රාග්ධන වියදම් දැරීමට අපේක්ෂිත වටිනාකමට සමගාමීව පිළියෙල කළයුතු වුවද, ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම වෙනුවෙන් අයවැය ප්‍රතිපාදනය රු.මිලියන 379.381 ක් වුවද රු.මිලියන 401.694 කින් යුත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණි.

(ඇ) තේ කොමසාරිස් අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන තේ ඉඩම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන පරිගණකගත කිරීම වෙනුවෙන් මෘදුකාංගයක් පිළියෙල කිරීම සඳහා 2017 ඔක්තෝබර් 09 දින රු.8,620,000 ක කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබූ නමුත් එය ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

(ඈ) මණ්ඩලය විසින් ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රමවේදයන් අනුගමනය කිරීමෙන් තොරව පෞද්ගලික ප්‍රවාහන සමාගමක සේවය ලබාගෙන තිබූ අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.2,813,578 ක වියදමක් දරා තිබුණි.

## 6.3 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර සියයට 12 සිට සියයට 58 දක්වා විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6.4 නොවිසඳී ඇති විගණන ඡේද

1957 අංක 51 දරන තේ පාලන පනතේ 49 වගන්තිය හා 1975 අංක 14 දරන තේ මණ්ඩල පනතේ 25(3) වගන්ති අනුව ලියාපදිංචි ගාස්තු, ලියාපදිංචි අලුත්කිරීමේ ගාස්තු හා බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීමේදී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකිරීම කලයුතුය. එහෙත් 2010 ජුලි 29 දින සිට ගාස්තු සංශෝධනය කිරීමේදී ඒ අනුව කටයුතු කර නොතිබූ බව 2014 වර්ෂයේ සිට විගණකාධිපති වාර්තා මගින් පෙන්වා දී තිබුණද ,සමාලෝචිත වර්ෂය දක්වා නිවැරදි කිරීමට කටයුතු කරනොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ පාලනය | දීර්ඝ කාලීනව පවතින ශේෂ අයකර ගැනීමට හා නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| (ආ) වත්කම් පාලනය | වත්කම් විධිමත් ලෙස පවරා නොගැනීම හා නිශ්කාර්යව පවතින වත්කම් උපයෝජනය කිරීමට අවශ්‍ය පියවර නොගැනීම. |
| (ඇ) කාර්ය මණ්ඩල කළමනාකරණය | අනුමත කාර්ය මණ්ඩලයට අන්තර්ගත නොවන තනතුරු සඳහා බඳවා ගැනීම |